# 3. දේව නිර්මාණයේ අඛණ්ඩ පැවැත්ම

දෙවිපියාණන් වහන්සේ අප වෙත මවා දුන් මනහර ලෝකය විස්මයජනකය. මිනිස් මනසට තේරුම් ගත නොහැකි බොහෝ දේ අදටත් මැවිල්ල තුළ නිර්මාණය වෙමින් පවතී. විශ්වයේ ආරම්භයේ සිට අද දක්වා සිදුවන දේව මැවිල්ලේ අඛණ්ඩ වර්ධනය පිළිබඳ මෙම පාඩමින් විමසා බැලීමට අපේක්ෂිත ය.

## ජෝබ් 36:25-33

**දිය බිඳු පොළවෙන් ඉහළට ඇදගෙන**
**වාෂ්ප මගින් වැසි වස්සන්නේ දෙවිඳාණෝ ය.**
**වලාකුළුවලින් වැස්ස මවා සව් සත වෙත එය එවන්නේ**
**එතුමාණෝය.**
**ජෝබ් 36: 27-28**

ඉහත බයිබල් පාඨය අධ්‍යයනය කිරීමෙන් අපට ජල බිඳුවක ක්‍රියාකාරීත්වය අවබෝධ වේ. එය කෙතරම් විස්මයජනක දේව නිර්මාණයක් දැයි සොයා බලමු.

ජලය
- ද්‍රවයකි
- වායුවකි
- ඝන ද්‍රවයකි

දේව නිර්මාණයක් වන ජල බිඳුව ලෝකය තුළ ද්‍රවයක් ලෙසත්, වායුවක් ලෙසත් තවත් විටෙක ඝන ද්‍රවයක් ලෙසත් ක්‍රියා කරයි. එය දේව මැවිල්ලේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය අද දිනයේ දී හෙළි කරන අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැක.

මෙම රූපයෙන් මෙය අවබෝධ කරගන්න.



මෙම දෙබසට අවධානය යොමු කරමු.

හිරු :- සුභ දවසක් වේවා! වැහි වලාව. සෑහෙන කාලයකට පස්සේ නේද අපි හමුවුණේ.

වැහි වලාකුළ :- ඔබටත් එසේම වේවා! ඔබ කී දේ හරි, මට ඔබ මුණ ගැසුණේ ටික කාලයකට පසුව තමයි.

හිරු :- මතක ද එදා ඔබ විශාල වර්ෂාවක් වෙලා පොළොව මතුපිටට වැටුණ දවස?

වැහි වලාකුළ :- මොකද මට මතක නැත්තේ? එදා ඉඳලා ජල බිඳුවක් ලෙස ලෝකයේ නොයෙක් තැන්වල සැරිසරලා මුළු පොළෝතලය ම සාරවත් කරලා තමයි ආයෙමත් මම අහසට ආවේ.

හිරු :- මට වෙලාවකට පුදුම හිතෙනවා ඔබේ ජීවිතය ගැන. අහසේ දී ඔබ වලාකුළක් ලෙස පොළොවේ අයට සෙවණ දෙනවා. වර්ෂාවක් ලෙස පොළොව සාරවත් කරනවා. නැවතත් ජල වාෂ්පයක් ලෙස අහසට නැග වලාකුළක් බවට පත් වෙනවා.

වැහි වලාකුළ :- පුදුම වෙන්න දෙයක් නැහැ යාළුවා මම වාගේ තව කොච්චර දේව නිර්මාණ දෙවියන් වහන්සේ මවා තිබෙනවා ද?

හිරු :- මොනවා ද ඒ නිර්මාණ

වැහි වලාකුළ :- ඔබ ගැන හිතන්න, ඔබ උදෑසන ලෝකය ආලෝකමත් කරලා සවසට බැස යනවා. ඔබේ යහළු සඳ රාත්‍රිය මුළුල්ලේ ම ලෝකය ආලෝකමත් කරලා උදෑසනට බැස යනවා.

හිරු :- ඇත්ත තමයි, අපි වාගේ විස්මිත දේව නිර්මාණ තව කොපමණ ඇද්ද? විස්මිත ලෙස අප මැවූ දෙවි පියාණන් වහන්සේට අපි තුති පුදමු.

ඉහත දෙබස තුළින් විශ්වයේ චක්‍රාකාරව පවතින දේව නිර්මාණ කීපයක් පිළිබඳව ඔබට වැටහෙන්නට ඇත. මිහිතලය තුළ චක්‍රාකාර ලෙස ඉදිරියට ගමන් කරන දේව නිර්මාණ කීපයක් පහත දැක්වේ.



ඉහත රූප සටහනට අනුව දෙවියන් වහන්සේගේ අඛණ්ඩ මැවීමේ ක්‍රියාවලිය කොතෙක් දුරට අද සිදුවේදැයි ඔබට වටහා ගත හැකි වේ. එම අඛණ්ඩ දේව ක්‍රියාකාරීත්වය නොමැතිව ලෝකයේ පැවැත්ම ඉදිරියට ගමන් නො කරයි. එයට ඔබට දායක විය හැකි අවස්ථා කීපයක් පහත දක්වේ.

ස්වාභාවික වනාන්තර ආරක්ෂා කිරීම.

? අවට පරිසරයේ තුරු ලතා ආරක්ෂා කිරීම.

? ජලය අරපිරිමැස්මෙන් භාවිතා කිරීම.

? පරිසරයේ ජීවත්වන සතුන්ගේ ජීවිත රැකගැනීම.

? වඳ වී ගෙන යන සතුන්ගේ ජීවිත සුරැකීම.

? අවිධිමත් ලෙස වගුරු බිම් ගොඩ කිරීමෙන් වැළකීම.

ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පරිසරයට සමීප ජීවිතයක් ගත කිරීමට ඔබට අවස්ථාව උදා වනු ඇත. ඒ තුළින් ඔබේ ජීවිතයට ද පරිසරයේ රැකවරණය ලැබේ.

දේව මැවිල්ලේ අඛණ්ඩ ක්‍රියාකාරීත්වය අතීතය වර්තමානය හා ස්ථිර ලෙස අනාගතය තුළ දී සදාකාලිකව ඉදිරියට ගමන් කරන්නකි. විශ්වයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව දෙවියන් වහන්සේට තුති පිදීම අපගේ යුතුකමකි. එපමණක් නොව දෙවි පියාණන් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන අයුරින් මැවිල්ලේ අඛණ්ඩ වර්ධනය උදෙසා ඇපකැප වීම අපගේ වගකීමකි.

## ක්‍රියාකාරකම

1. ශු. බයිබලයේ ජෝබ් 36:25-33 දක්වා පාඨයන් අධ්‍යයනය කර දෙවි පියාණන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය අද ද පවතින අවස්ථා කීපයක් ලියන්න.

2. අඛණ්ඩව සිදුවන දේව මැවිල්ල වර්ධනය කිරීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග 5 ලියන්න.